රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 386

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ - 07.
1987 දෙසැම්බර් මස 10 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ,
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

1987 සැප්තැම්බර් මස 30 වන දින සිට 1987 නොවැම්බර් මස 15 දින දක්වා කාලය තුළ ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්කවල ඇතිවූ කලබල නිසා දේපලවලට හානි සිදුවූ සහ/ හෝ ඒවල දේපල අහිමි වූ. එම දිස්ත්‍රික්කවල සේවයේ නියුතුව සිටි රජයේ සේවකයින්ට හා රාජ්‍ය සංස්ථා සේවකයින්ට වැටුප් අත්තිකාරම්..

---

1987 සැප්තැම්බර් මස 30 වන දින සිට 1987 නොවැම්බර් මස 15 දින දක්වා (දෙදිනම ඇතුළුව) කාලය ඇතුළත ත්‍රිකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවල ඇතිවූ කලබල හේතුකොටගෙන, එම දිස්ත්‍රික්කවල සේවයේ නියුතුව සිටි රජයේ හා රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ නිවෙස්වල දේපලවලට හානි සිදුවූයේ නම් සහ/හෝ ඒවල දේපල අහිමි වූයේ නම්, එවැනි රජයේ නිලධරයෙකු, සංස්ථා සේවකයෙකු සඳහා හෝ කලත්‍රයන් දෙදෙනාම රජයේ සේවයේ හෝ සංස්ථා සේවයේ වන විට, ඒ එක් එක් අයට වෙන වෙනම හෝ, කලත්‍රයන්ගෙන් එක් අයෙකු රජයේ නිලධාරියෙකු හා අනෙක් අය සංස්ථා සේවකයෙකු වන විට ඒ එක් එක් අයට වෙන වෙනම හෝ, 1985 නොවැම්බර් මස 22 දින හා අංක: 313 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන හා කොන්දේසි යටතේ වැටුප් අත්තිකාරමක් ගෙවිය හැක.

02. මෙම අත්තිකාරම සඳහා නියමිත ආකෘති පත්‍රයේ සකස් කළ අයදුම්පත් 1988.02.26 දින හෝ ඊට ප්‍රථම දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලැබෙන සේ එවිය යුතුය. 1984.01.19 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 237 ට අමුණා තිබූ ආදර්ශ අයදුම්පත්‍රය මේ සඳහා යොදා ගත හැකිය.

Siriwardhana
(ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.